සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
**චක්‍රලේඛ ලිපි අංක 33/2026**

මගේ අංකය: PPSC/ES/14/FI/06/29
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත් සභා සංකීර්ණය
නව නගරය - රත්නපුර
2026.08. 13

ලේකම්
පළාත් මාර්ග සංවර්ධන,ග්‍රාමීය යටිතල පහසුකම්
සංචාරක ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුර සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය -2026**

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ **විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුරේ** සේවය කරන නිලධාරීන්ගෙන් උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛ ලිපිය සබරගමුව පළාතේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුරේ සේවය කරන නිලධාරියාගේ **දැනගැනීම සඳහා වහාම යොමු කරන්න. මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ** www.psc.sg.gov.lk **හා සබරගමුව පළාත් සභා වෙබ් අඩවියේ** www.sg.gov.lk පළ කර ඇත.

02. බඳවා ගැනීමේ පරිපාටියට අනුව මෙම විභාගයේ විෂයය නිර්දේශය පහත සඳහන් පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| **ක්‍රීඩා පනත** | ක්‍රීඩා පනත ආශ්‍රයෙන් සකස් කරනු ලබන අර්ධ ව්‍යුහගත අභියෝගතා ප්‍රශ්න පත්‍රයකි. | පැය 03 | 100 | 40% |
| **මුදල් රෙගුලාසි** | ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය:<br><br>1.රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තු පාලනය<br>2.ඒකාබද්ධ අරමුදල හා එහි ක්‍රියාකාරීත්වය<br>3.විසර්ජනයේ අරමුණු හා විසර්ජන ක්‍රම<br>4.අවිනිශ්චිත අවස්ථා අරමුදල<br>5.භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය<br>6.විගණකාධිපති,ඔහුගේ බලතල හා කර්යභාරය<br>7.රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව(COPA)<br>8.පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) | පැය 02 | 100 | 40% |
| **පරිපාලනය** | 1.ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම<br><br>2.ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද: I,II,III,V,VI,VII,IX,XI,XII,XXIII,XXV,XXVI,XXVII,XXVIII,XXIX,XXX,XXXI,XXXII,XXXIII,XLVII හා XLVIII<br><br>3.රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති<br><br>4.කාර්යාල කළමනාකරණය | පැය 02 | 100 | 40% |

***සටහන:-*** **සාමාර්ථය සඳහා එක් විෂයකට 40%කට නොඅඩු ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතුය.**

03. **විභාගයට අයදුම්කිරීම -** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙළ කර ගත යුතු අතර, ඒ අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කරන කාර්යාලයේ ආයතන ප්‍රධානියා /දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් සබරගමුව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු වේ. පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ විසින් **2026.09.13** දින හෝ ඊට පෙර සබරගමුව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් මගින් මා වෙත අයදුම්පත් යොමු කළ යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **අයදුම්කරු ඉදිරිපත්ව නොමැති නම් විභාගයේ ඉදිරි කටයුතු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ද කඩිනමින් ලිඛිතව මා දැනුවත්** කරන මෙන් කාරුණිකව දන්වමි.

04. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සහිත අයදුම්කරු සඳහා පවත්වන දිනය, ස්ථානය හා වේලාව විභාග ප්‍රවේශ පත්‍ර මගින් අයදුම්පත්‍රයේ සඳහන් ලිපිනයට යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

05. තව ද විභාග වංචා සිදු කරන නිලධාරීන්ගේ විභාග ප්‍රතිඵල අත්හිටුවීමට කටයුතු කරන අතර, මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීම ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ බඳවා ගැනීම් පරිපාටියට අනුව සපුරාගත යුතු සුදුසුකමක් වන බැවින්, විභාගයට මුහුණ දීම වෙනුවෙන් ගමන්වියදම් හෝ වෙනත් දීමනා කිසිවක් ගෙවීමට හිමිකමක් නොමැත. මේ සම්බන්ධයෙන් ද අදාළ නිලධාරියා දැනුවත් කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

06. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

**පිටපත්**

1. ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කාරුණික දැනගැනීම සඳහා
2. පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ,ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව- සබරගමුව පළාත් සභාව — කාරුණික දැනගැනීම හා අදාළ නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුර සඳහා වන පළමු වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය -2026**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 1

දෙමළ - 2 ☐

(කොටුව තුළ අදාළ අංකය ලියන්න )

01. (a) මුල' කුරු සමඟ නම : ............................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA, A.B.

(b) සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ............................................................

............................................................

(c) මුල' කුරු සමඟ නම (සිංහලෙන් / දෙමළෙන්) : ............................................................

............................................................

(d) ස්ත්‍රී / පුරුෂ භාවය : ............................................................

(e) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(f) උපන් දිනය : ............................................................

(g) දුරකථන අංකය : රාජකාරි ............................................................

පෞද්ගලික ............................................................

02. සේවය කරන කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම :............................................................

............................................................

03. රාජකාරි ලිපිනය: ............................................................

............................................................

(ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

04. විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ - තාක්ෂණ තනතුරට පත් වූ දිනය :

............................................................

05. පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් : 01.........................................................................................

02.........................................................................................

03.........................................................................................

06. ඔබ විභාගයට ඉල්ලුම් කරන්නේ ප්‍රථම වතාවටද : ඔව්/ නැත.

07. එසේ නොවන්නේ නම්, විභාග ගාස්තු ගෙවා ලබාගත් (අමුණා ඇති) මුදල් භාරගැනීමේ කුවිතාන්සියේ,

අංකය................................ මුදල ................................

දිනය................................ විභාග ගාස්තු ගෙවූ. කාර්යාලය ........................................................

| |
|---|
| මුදල් භාරගැනීමේ කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න<br>*(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)* |

08. අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:-

........................................................
(අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන)

09. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

ඉහත නම සඳහන් අපේක්ෂකයා ඉදිරිපත් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව/ නිවැරදි නොවන බව සහතික කරමි.(නිවැරදි නොවන්නේ නම් හේතු දක්වන්න.)

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

දිනය :-

...............................................
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ
අත්සන හා පදවි නාමය
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)

10. අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය:

ඉහත නම් සඳහන් අපේක්ෂකයාට මෙම විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ඇති/නැති බව නිර්දේශ කරමි. (නිර්දේශ නොකරන්නේ නම් හේතු දක්වන්න)

.........................................................................................................................

.........................................................................................................................

.........................................................................................................................

දිනය :-

...............................................
ලේකම්
පළාත් මාර්ග සංවර්ධන. ග්‍රාමීය යටිතල පහසුකම්
සංචාරක, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
(කරුණාකර නිල මුද්‍රාව තබන්න.)